# විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපල විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය

# විශේෂිත නිපුණතා සහිත ජපන් රැකියා වැඩසටහන (SSW) සඳහා කුසලතා පරීක්ෂණයට අදාල පුහුණු පාඨමාලාවට අදම අයදුම්පත් යොමු කරන්න

ශ්‍රී ලංකා රජය හා ජපන් රජය අතර අත්සන් කරන ලද සහයෝගිතා ගිවිසුමට අනුව ශ්‍රී ලාංකික තරුණ තරුණියන්ට ජපානයේ පහත සඳහන් ක්ෂේත්‍ර දෙකට අදාළව රැකියා අවස්ථා උදාකර ගැනීමට අවශ්‍ය කුසලතා පරීක්ෂණය ඉදිරියේදී පැවැත්වීමට නියමිතය.

- හෙද සාත්තු සේවය
- ආහාර සේවා කර්මාන්තය

මෙම කුසලතා පරීක්ෂණ සඳහා අවශ්‍ය නිපුණතාවයන් ලබාදීමට විශේෂිත පුහුණු පාඨමාලා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පුහුණු මධ්‍යස්ථානවල ආරම්භ කර ඇත.

එම පුහුණු පාඨමාලාව සඳහා අයදුම් කිරීමට ඔබ කැමැත්තක් දක්වන්නේ නම් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ www.slbfe.lk වෙබ් ද්වාරයෙහි SSW JAPAN සබැඳියට පිවිස අයදුම් කළ හැකිය.

මාස 03 ක පාඨමාලා කාලයක් සඳහා පාඨමාලා ගාස්තු රු.15000 /= ක් පහත සඳහන් ගිණුම් අංකය වෙත බැර කිරීමෙන් පසු කුවිතාන්සියෙහි ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කර ඡායාරූපයක් (Image) රැගෙන ඉහත වෙබ් ද්වාරය ඔස්සේ උඩුගත (Upload) කළ යුතුය.
**(මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදුකරනු ලබන ගෙවීම් භාරගනු නොලැබේ.)**

- ගිණුමෙහි නම - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
- බැංකුවේ නම - ලංකා බැංකුව
- ශාඛාව - ආයතනික ශාඛාව
- ගිණුම් අංකය - 1650
- බැංකුවේ ලිපිනය - ලංකා බැංකුව, ආයතනික ශාඛාව, කොළඹ

අවශ්‍ය සුදුසුකම් පිළිබඳ විස්තර දැන ගැනීම සඳහා www.slbfe.lk යන කාර්යාංශ වෙබ් ද්වාරයෙහි SSW JAPAN සබැඳියට පිවිසෙන්න.

වැඩි විස්තර සඳහා 0112 076 446

(සති අන්ත සහ රජයේ නිවාඩු දින වලදී හැර පෙ.ව 08.30 සිට ප.ව.04.30 දක්වා)

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය**

# විශේෂිත නිපුණතා සහිත ජපන් රැකියා වැඩසටහන (SSW)

## කුසලතා පරීක්ෂණය සඳහා අවශ්‍ය සුදුසුකම්

- අවුරුදු 17 හෝ ඊට වැඩි අයදුම්කරුවන් හට කුසලතා පරීක්ෂණයට පෙනී සිටිය හැක.

  උපරිම වයස් සීමාවක් පිළිබඳව ජපානය විසින් දැනුම් දී නැති අතර කුසලතා පරීක්ෂණය සමත් වන අයදුම්කරුවන් රැකියා සඳහා බඳවා ගැනීමේදී වයස් සීමාව තීරණය කිරීම ජපානයේ සේවායෝජකගේ අභිමතය පරිදි සිදුවේ.

- අයදුම් කරනු ලබන ක්ෂේත්‍රය සඳහා ඔබට මනා කාර්මික හෝ වෘත්තීය කුසලතාවයක් හෝ ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්දක් ලබා තිබීම කුසලතා පරීක්ෂණයෙන් සමත් වීමට ඉවහල් වේ.

- ජපන් භාෂා දැනුම N4 මට්ටමේ හෝ ඊට වැඩි මට්ටමක තිබේ නම් කුසලතා පරීක්ෂණයට සාර්ථකව මුහුණ දිය හැකිය.

- JLPT N4 සමත් නම් JFT පරීක්ෂණයෙන් නිදහස් කෙරේ.

## බඳවා ගැනීමේ ක්‍රමවේදය

- භාෂා පරීක්ෂණ
- කුසලතා පරීක්ෂණ
- සම්මුඛ පරීක්ෂණ